# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1864/33 - 2014 මැයි මස 27 වැනි අඟහරුවාදා - 2014.05.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩමේ පරවශ්‍යතාවය ලබාගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තරය :* -

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, හලාවත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මුන්නේෂ්වරම් පත්තුවේ මුන්නේෂ්වරම් ගමේ පිහිටි පුත්තලම මිනුම් අධිකාරි විසින් සම්පාදිත ඔහු භාරයේ ඇති මු.පි.පු. 4952 පිඹුරේ කැබලි අංක 01 දරන ප්‍රමාණයෙන් හෙක්ටයාර 0.0031ක් වූ ඉරුන්දතෝට්ටම් නමැති ඉඩමේ පරවශ්‍යතාවය ලබා ගැනීම සඳහා.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම, තමතමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2014 අගෝස්තු මස 20 වැනි දින පෙ. ව. 10.30ට හලාවත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2014 අගෝස්තු මස 20 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු යි.

යූ. එස්. එන්. ප්‍රනාන්දු,
ප්‍රාදේශීය ලේකම්,
හලාවත.

2014 මැයි මස 26 වැනි දින,
හලාවත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

06-271

---

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :* -

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, හලාවත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මුන්නේෂ්වරම් පත්තුවේ මුන්නේෂ්වරම් ගමේ පිහිටි පුත්තලම මිනුම් අධිකාරි විසින් සම්පාදිත ඔහු භාරයේ ඇති මු. පි. පු. 4961 පිඹුරේ විහාරවත්ත *හෙවත්* පුෂ්පාරාම නමැති ඉඩමේ කැබලි අංක 01 දරන,



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*උතුරට* : පු 2795 වැනි මූලික පිඹුරේ කැබලි අංක 08; *නැගෙනහිරට* : පු 2795 වැනි මූලික පිඹුරේ කැබලි අංක 08 හා ප්‍රාදේශීය සභා මාර්ගය; *දකුණට* : ප්‍රාදේශීය සභා මාර්ගය හා පු 2795 වැනි මූලික පිඹුරේ කැබලි අංක 08; *බටහිරට* : පු 2795 වැනි මූලික පිඹුරේ කැබලි අංක 08 මායිම්වලින් යුත් හෙක්ටයාර 0.0127ක ප්‍රමාණයෙන් යුත් විහාරවත්ත *හෙවත්* පුෂ්පාරාම ඉඩම.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම, තමතමන් හෝ ඔවුන්ගේ ලියවිලි වලින් බලයලත් අයවලුන් හෝ 2014 අගෝස්තු මස 20 වැනි දින පෙ. ව. 11.00 ට හලාවත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2014 අගෝස්තු මස 20 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු යි.

යූ. එස්. එන්. ප්‍රනාන්දු,
ප්‍රාදේශීය ලේකම්,
හලාවත.

2014 මැයි මස 26 වැනි දින,
හලාවත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

06 - 272

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.